අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 2 - 2022

-----------------------------------------------------------

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අධියර 2 හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 17 දින එලඹි අංක එස්.එල්-පී 115 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 18 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්ථා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්ථාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම තුලින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩි කිරීමත්, එමඟින් ව්‍යාපෘති ප්‍රදේශයේ සෞඛ්‍ය තත්වය හා ජීවන පරිසරය වැඩි දියුණු කිරීම් වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රධාන කොටස් 04ක් යටතේ ක්‍රියාත්මක වේ, එනම් ජල පිරිපහදු මධ්‍යස්ථානය සහ ඒ ආශ්‍රිත පහසුකම්, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ නල මාර්ග සැපයීම සහ ඉදිකිරීම, මෙහෙයුම් සහ නඩත්තු සඳහා උපකරණ සහ අනෙකුත් අදාළ භාණ්ඩ, උපදේශන සේවා. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 31,598 කට සමාන ජපාන යෙන් මිලියන 27,301 ක් සහ ඉන් රු.මිලියන 26,778 කට සමාන ජපාන යෙන් මිලියන 23,137 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. තවද, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයෙන් රු.මිලියන 22,464 ට සමාන ජපන් යෙන් මිලියන 19,409 ක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා වෙන්කර ඇති අතර ඉතිරි රු.මිලියන 4,315 ට සමාන ජපන් යෙන් මිලියන 3,728 ක මුදල ව්‍යාපෘති අදියර I හි ක්‍රියාකාරකම් සඳහා වෙන්කර ඇත. ඊට අමතරව ජපාන යෙන් මිලියන 4,164 ක ට සමාන රුපියල් මිලියන 48.20 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක විය යුතුය. ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් 2017 ජූනි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2024 ජූනි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 07 වැනි ඡේදයට අනුව, දේපල, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැය වත්කමක් ලෙස පිළිගත යුතුය, කෙසේ නමුත් මුළු වටිනාකම රුපියල් මිලියන 4.3 ක් වූ ගෘහ භාණ්ඩ අයිතම 15 ක්, කාර්යාල උපකරණ අයිතම 23 ක් සහ පරිගණක 33 ක් ඉහත ගිණුම්කරණ ප්‍රමිතියට පටහැනිව කෙරීගෙන යන වැඩ ගිණුමෙහි සටහන් කර තිබුණි. | 2023 වර්ෂ අවසාන ගිණුම්වල ගැලපීම සිදු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට කටයුතු කළ යුතුය . |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| අංක 01/2019 කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 වගන්තිය. | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, 2017 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා එකදු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි. | ඉදිකිරීම් සහ ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්විය හැකිය. | නීති රීති වලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

## 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘති ක්‍රියාකාරකම | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | විස්තරාත්මක සැලසුම් සහ ලංසු පිළියෙල කිරීමේ සහාය සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව. | මුල් උපදේශන කොන්ත්‍රාත් කාලය 2018 මැයි 01 සිට 2020 පෙබරවාරි 29 දක්වා මාස 22 ක් වුවද, ඒ අනුව ව්‍යාපෘතිය සැලසුම් කිරීම සඳහා දැනටමත් මාස 44ක් ගෙන ඇති අතර ප්‍රමාද කාලය මාස 22 ක් වී තිබුණි. | ජල මූලාශ්‍රය වෙනස් වීම හේතුවෙන් මාස 18කට ආසන්න කාලයක් විස්තරාත්මක සැලසුම් ප්‍රමාද විය. 2019 අප්‍රේල් 21 වන දින පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතියෙහි අනපේක්ෂිත ප්‍රමාදයක් ඇති කිරීමට හේතු වී ඇත. | ව්‍යාපෘතිය අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | ජල තුළමුව පහසුකම්, ජල | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මෙම සංරචකයේ වැඩ 2017 | ජල සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් මත, | ව්‍යාපෘතිය අවසන් කිරීමට කඩිනම් පියවර |

| | | | | |
|---|---|---|---|---|
| | පවිත්‍රාගාරය, ජල ගබඩා, යාන්ත්‍රික විදුලි හා ගොඩනැගිලි වැඩ ඉදිකිරීම - (ලොට් අංක - අ) | මාර්තු මස ආරම්භ කර 2022 ජනවාරි මස අවසන් කළ යුතුය, කෙසේ වෙතත් එය 2022 දෙසැම්බර් 31 දින වන විටත් පූර්ව ඉදිකිරීම් ක්‍රියාවලියක පැවතුනි. | රටේ පවතින ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් සහ ජපන් සහයෝගිතා ආයතනයේ අරමුදල් ලබා දීමේ එකඟතාවයන් නැවත ආරම්භ කරන තෙක් ලංසු ඉදිරිපත් කිරීමේ දිනය දින නියමයක් නොමැතිව දීර්ඝ කර ඇත. | ගත යුතුය . |
| (ඇ) | සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම. | පැකේජ අංක B,C1,C2,C3 යන කොටස් වලට අදාල මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2017 මාර්තු මස ආරම්භ කර 2022 අප්‍රේල් මස අවසන් කිරීමට නියමිතව තිබුනද, එය 2022 දෙසැම්බර් 31 දිනට පවා පූර්ව ඉදිකිරීම් ක්‍රියාවලියක පැවතුනි. | කෙසේ වෙතත්, 2022 අප්‍රේල් මාසයේ සිට ජපන් සහයෝගිතා ආයතනය මුදල් ලබාදීම තාවකාලිකව අත්හිටුවීම සහ එකඟතා ලබාදීමත්, රටේ වත්මන් ආර්ථික අර්බුදකාරී තත්ත්වයත් හේතුවෙන් කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාද වෙමින් පවතී. | ව්‍යාපෘතිය අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඈ) | මෙහෙයුම් සහ නඩත්තු සඳහා උපකරණ සහ වෙනත් අදාළ භාණ්ඩ | සැලසුම් ක්‍රියාවලියට අනුව මෙම සංරචකය 2017 නොවැම්බර් 17 දින ආරම්භ කර 2018 නොවැම්බර් 17 දින සම්පූර්ණ කළ යුතු වුවද එය 2022 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියර තවමත් ආරම්භ කර නොමැති බැවින්, මෙම අදියරේදී මෙම වාහන අවශ්‍ය නොවේ. | ව්‍යාපෘති කටයුතු ප්‍රමාදයකින් තොරව කරගෙන යාමට හැකිවන පරිදි සුදුසු කාල සීමාවන් තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය. |

**3.2** මතභේදයට තුඩු දුන් කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| මෙම ව්‍යාපෘතිය මගින් දන්ත හා අස්ථි ෆ්ලෝරෝසිස් ඇති කරන එමෙන්ම නිදන්ගත වකුගඩු රෝගය පැතිරීම සඳහා ප්‍රධාන අන්තරායකාරී සාධකයක්ද වන අනාරක්ෂිත දූෂිත භූගත ජලයෙන් යැපෙන කැබිතිගොල්ලෑව, පදවිය, හොරොව්පොතාන සහ කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශ ආවරණය කරයි. එබැවින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇති අතර ව්‍යාපෘතිය 2017 ජුනි මස සිට ආරම්භ කර 2024 ජුනි මස අවසන් කිරීමට නියමිතව තිබුණි. පවුල් 50,000ක් ප්‍රතිලාභීන් ලෙස ඉලක්ක කර සුරක්ෂිත පානීය ජලය බලාපොරොත්තුවෙන් සිටියද මාස 66ක් ගතවී ඇතත් මෙම ව්යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්රාත්තුව මෙතෙක් ලබාදී නොමැත. එහි ප්රතිඵලයක් ලෙස සියලුම ක්රියාකාරකම් ප්රසම්පාදන ක්රියාවලිය යටතේ පැවති අතර මෙම තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්රතිලාභ ඉලක්කගත ප්රතිලාභීන් වෙත ළඟා කර ගැනීමේ අවදානමක් ඇතිවී තිබුණි. | ජපන් සහයෝගිතා ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට සියලුම ණය වාරික ලබාදීම සහ එකඟතාවයන් ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. එබැවින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම තවදුරටත් ප්‍රමාද වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. | පවතින ගැටලු මඟහරවාගෙන ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |